# ආටානාටිය සූත්‍රයෙන් හෙළි වන බෞද්ධ රාජ්‍ය පාලන මූලධර්ම

තේජෝ බල, ආරක්ෂක පරිත්‍රාණ ධර්ම දේශනයක් ලෙස බෞද්ධයා අතර ප්‍රකට ආටානාටිය සූත්‍රය ඇතුළත් වන්නේ දික්සඟියේ, පාටිකවග්ගයටය. මෙය "චතුභාණවරපාලි" නම් වූ පිරිත් පොතෙහි අවසාන සූත්‍රය වශයෙන් සංග්‍රහ කොට තිබේ. භාග්‍යවතුන් වහන්සේගේ සස්න කෙරෙහි නොපහන් වූ තෙදැති යක්ෂයන්ගේ පැහැදීම පිණිසද භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යන සිව් පිරිස් වැසියන්ගේ රක්ෂණ ගෝපනය පිණිසද, ආරක්ෂාව පිණිසද, පීඩාවක් නොවනු පිණිසද, පහසු වාසය පිණිසද, ආටානාටිය සූත්‍රය දේශනා කරන ලද්දේ බුදුන් වහන්සේගේ අනුමැතිය පරිදි යක්ෂාධිපති කුවේර වෛශ්‍රවණ (වෙසමුණි) මහ රජුන් විසිනි.

ආටානාටිය සූත්‍රය සියුම්ව පිරික්සා බැලීමේදී පෙනෙන, ප්‍රධාන කරුණක් වන්නේ මෙය හුදෙක් පිරිත් දේශනාවක් පමණක් නොව, බෞද්ධ රාජ්‍ය පාලන මූලධර්ම වලින්ද හෙබි ඉගැන්වීම් රැසක් අන්තර්ගත දේශනාවක් ලෙසටය. බුදුන් වහන්සේ යහපත් රාජ්‍ය පාලනයක් සඳහා ද සමෘද්ධිමත් රාජ්‍යයක් ගොඩනඟා ගැනීම සඳහා ද වූ විශිෂ්ට ඉගැන්වීම් රැසක්ද සූත්‍ර දේශනා රැසක සඳහන් කර තිබෙන අයුරු දැකිය හැක. දීඝ නිකායේ එන චක්කවත්ති සීහනාද සූත්‍රයේ දස සක්විති වත, දීඝ නිකායේ මහා පරිනිබ්බාණ සූත්‍රයේ දී හමුවන සප්ත අපරිහානීය ධර්ම, පන්සිය පනස් ජාතක පොතෙහි වූ මහා හංස ජාතකයේ එන දස රාජ ධර්ම ආදී ප්‍රධාන ඉගැන්වීම් රැසකද සතර සංග්‍රහ වස්තුව, සතර අගතිය, සතර බ්‍රහ්ම විහරණ යනාදී ඉගැන්වීම් වලින්ද යහපත් රාජ්‍ය පාලනයක් උදෙසා බුදු දහමින් නිර්දේශිත මූලධර්මයන් අන්තර්ගතය. රාජ්‍යය සමෘද්ධිමත් කර ගැනීම සඳහා රාජ්‍ය භාණ්ඩාගාරය සතු ධනය විධිමත් ලෙස ජනතාව අතර මුදාහැරිය යුතු ආකාරය දැක්වෙන්නේ දීඝ නිකායේ කූටදන්ත සූත්‍රයේය.

බුදු සමයෙන් උවසු උවැසියන්ගේ ජීවන ප්‍රතිපදාව ලෙස හඳුන්වා දී ඇති පංච ශීලයෙහිද රාජ්‍ය පාලනය උදෙසා උකහා ගත හැකි වැදගත් ඉගැන්වීම් අන්තර්ගත බව පෙන්වා දෙන්නේ ආටානාටිය සූත්‍රය තුළිනි. ආටානාටීය සූත්‍රයට අනුව ඇතැම් යක්ෂයන් බුදුන් වහන්සේට පැහැදී සිටිය නමුත්, බොහෝ යක්ෂයෝ බුදුන් කෙරෙහි නොපැහැදුණුවෝ වෙති. එයට හේතුව නම් ඔවුන් ප්‍රාණඝාතයෙන් වැළකීම, සොරකම් කිරීමෙන් වැළකීම කාමයෙහි වැරදි හැසිරීමෙන් වැළකීම, මුසාවෙන් වැළකීම මතින් වැළකීම ලෙස ගෙනහැර දක්වා ඇති පංචශීල ප්‍රතිපත්තිය කෙරෙහි අප්‍රිය, අමනාප වීමයි. යමෙක් බුදුන් වහන්සේ කෙරෙහි පැහැදී සිටින්නේද, හෙතෙම පංචශීල ප්‍රතිපදා අනුගමනය කරන අතර, යමෙක් බුදුන් වහන්සේ කෙරෙහි නොපැහැදෙන්නේ ද හෙතෙම පංචශීල ප්‍රතිපදාවෙන් බැහැර වූවෙකු බවත්, පංචශීලය අනුගමනය කරන සියලු දෙනා අවිහිංසා සුඛ විහරණය පිණිස ආරක්ෂා වන බවත් ආටානාටිය සූත්‍රයෙන් විශද වන මුඛ්‍ය අදහසකි.

රාජ්‍ය පාලනය විෂයෙහි ආටානාටිය සූත්‍රයෙහි වැදගත්කම අංශ දෙකකින් සමාලෝචනය කළ හැකිය.

එනම්,

1. පංචශීල ප්‍රතිපදාවට අනුව රාජ්‍ය පාලන ක්‍රමවේදය සැලසුම් සහගත කර ගැනීමට උපදෙස් දීම.

2. රාජ්‍ය පාලන තන්ත්‍රය මනාව සැලසුම් සහගත කිරීම තුළින් සමෘද්ධිමත් තිරසාර සංවර්ධනයක් අත්පත් කරගත හැකි බව පෙන්වා දීම.ආදියයි.

පංචශීල ප්‍රතිපදාවට අනුව රාජ්‍ය පාලන ක්‍රමවේදය අංග දෙකකින් විධිමත් විය යුතු බවද, ආටානාටිය සූත්‍රය පෙන්වා දෙයි. එනම්

1. පංචශීල ප්‍රතිපදාව මත පාලකයා තමාගේ භූමිකාව ක්‍රියාවට නැංවීම. 2. පංචශීල ප්‍රතිපදාව මත පාලකයා ජනතාවගේ පැවැත්ම තහවුරු කිරීම.ආදියයි.

ආටානාටිය සූත්‍ර දේශනාවට අනුව, සක්දෙව් රජුගේ ආරක්ෂාව පිණිස සතර වරම් දෙවිවරු සතර දිශාවෙහි වාසය කරති. ගාන්ධර්වයන්ට අධිපති ධෘතරාෂ්ට මහරජ, කුම්භාණ්ඩයන්ට අධිපති විරූඪක මහරජ, නාගයන්ට අධිපති විරූපාක්ෂ මහරජ, යක්ෂයන්ට අධිපති වෛශ්‍රවණ මහරජ සිය පිරිස සමග ජීවත් වන්නේ සශ්‍රීක, සමෘද්ධිමත් ලෙසය. එම සතර වරම් දෙවිවරු ස්වකීය ජනයා උදෙසා ආදර්ශවත් වන්නේ මමත්වයෙන් තොරවය. එමෙන්ම ඔවුන් ස්ත්‍රීන් කෙරෙහි කිසිදු පරිග්‍රහයකින් තොරය. (මනුස්සා තත්ථ ජායන්ති - අමමා අපරිග්ගහ)

ජනතාව විෂයෙහි පෙනී සිටිනා පාලකයා නිබඳවම අර්ථයෙන්, ධර්මයෙන් කටයුතු කළ යුතුය. ඒ සඳහා පාලකයාට අර්ථයෙන්, ධර්මයෙන් උපදෙස් සලසන පිරිසකගේ ආධාර නිබඳවම ලබා ගැනීමට සිදු වේ. වෛශ්‍රවණ මහ රජු තමන්ට අර්ථයෙන් ධර්මයෙන් කරුණු විමසීම සඳහා කිහිප දෙනෙකුගෙන් යුත් (කතෝලා, නත්තලා, කතෝතලා, ඕජසී, තේජසී, තතෝජසී, සූර රාජ, සූරරාජ, නෙමි, අරිට්ඨ යනාදී වූ) උපදේශක මණ්ඩලයක් පත්කොට තිබෙන ආකාරය ආටානාටිය සූත්‍රයෙන් පැහැදිලි වෙයි. ආටානාටිය සූත්‍ර අටුවාවට අනුව වෙසමුණි මහරජ එම උපදේශක මණ්ඩලයෙන් අර්ථයෙන් ධර්මයෙන් උපදෙස් ගන්නා ආකාරයද රටක් සංවර්ධනය විෂයෙහි අතිශයින් වැදගත් පණිවිඩයක් විශද කරයි. එනම් පාලකයා රාජ්‍ය සමෘද්ධිය සහ ජනතා සුබසාධනය සිදු කරන්නේ අත්තනෝමතිකව තම සිතැඟිවලට අනුව නම්, එය ඇතැම් විටෙක ඵලදායී නොවනු ඇත. ජනතාව උදෙසා මෙහෙයවන යම් සංවර්ධන ක්‍රියා මාර්ගයක් ක්‍රියාවට නැංවිය යුත්තේ ජනතා අවශ්‍යතා අනුවයි. එසේම වෛශ්‍රවණ මහරජුගේ ඉහත කී උපදේශක මණ්ඩලයට ජනතාව අතර රැඳී සිට ජනතා අවශ්‍යතා සොයා බලා ගත යුතු ක්‍රියා මාර්ග පරීක්ෂා කොට උපදෙස් දෙන්නේ, එම රාජ්‍යයේ දොරටු පාලක මණ්ඩලයටයි. දොරටු පාලක මණ්ඩලය එම පණිවිඩය පරීක්ෂා කොට වෛශ්‍රවණ මහරජුට දැනුම් දෙන අතර එහි යෝග්‍යතාව අනුව මහ රජු එයට අනුමැතිය ලබා දෙයි. වෛශ්‍රවණ මහරජු ඇසුරෙන් ආටානාටිය සූත්‍රයෙන් දැක්වෙන මෙම විග්‍රහය තුළින් පිළිබිඹු වන්නේ රටක් සංවර්ධනය කිරීම විෂයෙහි ඉටු විය යුතු ප්‍රායෝගික ක්‍රමවේදය නොවන්නේද?

රටක් සංවර්ධනය විෂයෙහි භෞතික අංශයේ දියුණුව පමණක් නොසෑහේ. එහිලා වාසය කරන ජනතාවගේ සදාචාරාත්මක පැවැත්මද දියුණු විය යුතුය. පංචශීලය මූලධර්මය කොටගෙන පාලනය ගෙනයන සතරවරම් දෙවිවරු මේ සඳහා දඬුවම් ක්‍රමවේදයක් භාවිත කරන ආකාරයද ආටානාටිය සූත්‍රයෙන් හෙළි වේ. පංචශීල ප්‍රතිපදාව කඩකරන්නන්ට එරෙහිව දඬුවම් ලබා දෙන්නේ මගධයේ රජු සිය පාලන තන්ත්‍රය තුළ ජනතාවට දඬුවම් දෙන ආකාරයටය. මේ අනුව පංචශීලය රක්නා යහපත් අයෙකුට, පංචශීලය නොරක්නා අයෙක් කරදරයක් කළහොත් ඔහුට මුහුණ පාන්නට සිදු වන දඬුවම් කිහිපයක් ආටානාටිය සූත්‍රයෙන් මතුවේ. එනම්,

1. තම රාජ්‍යයෙහි ගෞරවමාන හා සත්කාර අහිමි කිරීම. 2. ආලකමන්දාවෙහි කිසිදු වාසස්ථානයකින් තොරව පිටුවහල් කිරීම. 3. ආවාහ විවාහ තහනම් කිරීම. 4. අක්‍රෝශ පරිභවයෙන් බැණ වැදීම 5. රත් වූ ලෝහ පාත්‍රයක් හිස ලෑම. 6. හිස සත්කඩකට පැලීම 7. සතරවරම් දෙවිවරුන්ගේ සතුරන් ලෙස නම් කිරීම යනාදියයි.

මෙලෙස සතරවරම් දෙවිවරුන්ට සිය පාලනය පහසු කරගෙන යෑම සඳහා මහාමාත්‍ය, අමාත්‍ය, සේනාපති, මහාසේනාපතිවරුන් සහාය සපයන අතර එබඳු පිරිස් තිස්හතකගේ නාම ලේඛනයක් ආටානාටිය සූත්‍රයේ සඳහන් වේ.

රාජ්‍ය පාලන තන්ත්‍රය මනාව සැලසුම් සහගත කිරීම තුළින් තිරසාර සංවර්ධනයක් අත්පත් කරගත හැකි බව ආටානාටිය සූත්‍රය තුළින් පෙන්වා දෙන වැදගත් කරුණකි. දැහැමෙන් සෙමෙන් රාජ්‍යය හොබවන සතර වරම් දෙවිවරු සිය ජනයා පෙරටු කොට ගෙන නැටුමෙන් ගැයුමෙන් සිත් පොබයමින් වෙසෙති. රටක තිරසාර සංවර්ධන ක්‍රියාදාමය තුළ දේශපාලනික, ආර්ථික කටයුතු මෙන්ම පාරිසරික සෞන්දර්යය කෙරෙහිද විශේෂ අවධානය යොමු විය යුතු ආකාරය ආටානාටිය සූත්‍රයේ විස්තර වර්ණනාවකින් යුක්තව පෙන්වා දෙනුයේ වත්මන් සමාජයටද උපදේශ රැසක් සපයමිනි.

අවසාන වශයෙන් ආටානාටිය සූත්‍රයෙන් හෙළි වන පරිදි, පරමාදර්ශී රාජ්‍යයක අඩංගු විය යුතු ප්‍රධාන කරුණු පහත පරිදි සාරාංශ කළ හැක.

1. රටක් තිරසාර සංවර්ධනය කරා ගෙන යෑමේදී පාලක - පාලිත ඇතුළු සමස්ත සමාජයේම දායකත්වය පංචශීල ප්‍රතිපදාව මත රඳවා තිබීම.

2. සමාජ, ආර්ථික, දේශපාලනික, නෛතික, පාරිසරික යනාදී අංශ පමණක් නොව සමාජයේ සියලු දෙනාගේ සදාචාරාත්මක, ආධ්‍යාත්මික අංශය දියුණුවද වැදගත් කොට සැලකීම.

3. දැහැමින් සෙමින් රාජ්‍ය පාලනය කිරීම සඳහා රජුට සිටිය යුත්තේ දැහැමින් සෙමින් උපදෙස් සපයන බහුශ්‍රැතයන් පිරිසකි.

4 ජනවිඥානයට සවන් දෙමින් පාලකයින් ජනතා අවශ්‍යතා ඉටු කළ යුතු යුත්තේ ජනතාවගේ ආශිර්වාදය තුළිනි.

මේ අනුව ආරක්‍ෂක පරිත්‍රාණ දේශනයක් ලෙස මෙන්ම පංචශීල ප්‍රතිපත්තිමය ප්‍රවේශයකින් රාජ්‍ය සමෘද්ධිය අගයන ආටානාටිය සූත්‍රය ධරණීය සංවර්ධනයෙහිලා සපයන පිටිවහල සුළු පටු නොවන බව පෙනේ.